විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව

# සිහිනයක්, වගේ....

20 වන කොටස

ස්නේහා මේනක ගේ මුහුණ බැලුවේ පුදුමයෙනි. ඔහු කියූ දේ ඇයට නොවැටහෙයි. ඔහු තමා ආරක්ෂා කරන්නට උත්සාහ කරන්නේ ඇයිදැයි තේරුම් ගන්නට ඇයට නොහැකි ය. ඇගේ සිතට ඇතුල්වන්නේ තේරුම්ගත නොහැකි බියක් වැනි හැඟීමකි. ධනය බලය සහ කීර්තිය විසින් මහා ඉහළට ඔසවා තබනු ලැබූ මේ තරුණ වෛද්‍යවරයා තමාට මේ සා සමීප වන්නට තැත්කිරීම විශ්වාස කළ නොහැක්කක් ලෙස ඇයට දැනෙයි.

"මං ගැන මහන්සිවෙන්න එපා සර්.. මං මගේ ගමන මේ විදිහට හෙමින් යන්නම්" ස්නේහා මිමිණුවා ය. මේනක පිළිතුරක් දෙන්නට නොවෙහෙසුණේ ය.

"මං කිව්වදේ ඇහුණ නේද සර්..?" ස්නේහා නැවත ඇසුරනේ එනිසා ය. "..මේ ලංකාවෙ සර් ගැන නොදන්න කෙනෙක් නැහැ.. මං වගේ දුප්පත් කෙල්ලෙකුට උදව් කරන්න ගිහින් සර්ගෙ හොඳ නම නැති කරගන්න එපා.."

ඔහු හිස ඔසවා ඇය දෙස හෙලුවේ දැඩි බැල්මකි. කියන්නට උත්සාහ කළ යමක් ගිල ගත්තා සේ ඔහු මොහොතක් බලා සිටියේ ය. "පැහෙන්න එපා" ඔහු ඉන්පසු කීවේ ය.

කතාවේ මාතෘකාව ඔවුන් දෙදෙනා වෙතින් ඉවතටගත් මේනක ඉන්පසු ඒ සැන්දෑවේම කතා කළේ වෙනත් වල්පල් දේ ය. ලෙඩුන් බලද්දී සිදුවුණ දහසකුත් එකක් රසවත් දේ ඔහු ස්නේහා සමග බෙදාගත්තේ සිනාසෙමින් ය. රෝහලේදී හමුවන මේනක දොස්තර මහතාත් මේ මේනකත් අතර වෙනස ස්නේහාට තේරුම් ගත නොහැකි තරම් විශාල එකක් විය. ඒ සා බර සාර දොස්තර මහත්තයාට මේ තරම් සැහැල්ලුවෙන් කතා කරන්නට හැකිවීම ස්නේහාට පුදුමයක් විය. ඒ සැහැල්ලු කතාබහ ස්නේහා ගේ සිතේ තිබූ බර සැහැල්ලු කළාක් මෙන් විය. සැබැවින්ම ඒ සැන්දෑව සිය ජීවිත කාලයේ ගත කළ
සුන්දරම සැන්දෑව විය හැකි යයි බෝඩිම අසළින් කාරයෙන් බසින අතර ද ස්නේහාට සිතුණි.

ජීවිතයේ වෙමින් තිබෙන්නේ කිසිදාක සිහිනෙන්වත් පැතූ දෙයක් නොවන බව කෙසේ නම් අදහන්නද? මෙය හීනයක් නම් ඒ හීනය තමන්ගේ තරමට වඩා විශාල වැඩි බව ස්නේහාට දැනෙයි. මේ ගමනේ දෙකළවර තමා නතරවනු ඇත්තේ හිතාගන්නටවත් බැරි තරමේ අවුලක විය හැකි බව ඇගේ සිත කියයි.

"කල්පනාවෙන් වැඩ කරගන්න.. කිකිසම දේකට කලබල වෙන්න එපා.. ඕනෙම වෙලාවක මට මේ නම්බර් එකට කෝල් එකක් දෙන්න" මේනක වෙන්ව යන මොහොතේ කීවේ ය. ඔහු ස්නේහාට දුන් අංකය ඔහුගේ පුද්ගලික දුරකතනයේ අංකය විය. ඒ අංකය දැන සිටියේ ඔහුට වඩාත්ම සමීප කීපදෙනකු පමණකි. නානකාමරයට වැදී සෑහෙන වේලාවක් ඇඟ පත සෝදා ගත් ස්නේහා ඇඳට වැටුණේ මුවේ රැඳවාගත් සිනාවක් ඇතිවය. ඒ සුන්දර සැන්දෑව මේ තරම් ඉක්මණට අවසන් කරගන්නට ඇයට සිතක් නොවී ය. දුරකතනය නාදවූයේ ඒ වෙලාවේම ය.

"ස්නේහා... මං අකලංක" අකලංක ගේ කටහඬ ඇසෙයි. ස්නේහා පිලිතුරක් නොදී අසා සිටියා ය. "මං හවසත් ඔයාට කෝල් එකක් ගන්න ට්‍රයි කළා" ඔහු කීවේ ය.

"ෆෝන් එක ඕෆ් කරලා තිබුණෙ" ස්නේහා කීවා ය.

"ඒක හොඳයි.." ඔහු කීවේ ය.

"මොකක්ද හොඳ?"

"ෆෝන් එක ඕෆ් කරලා තිබ්බ එක.... ෆෝන් එක ඔන් එකේ තිබ්බා නම් සැරින් සැරේ කෝල් කරන අය නිසා සුන්දර සැන්දෑව අවලස්සන වෙන්න තිබ්බනෙ.. නේද?" ඔහු ඇසුවේ ය.

"මට තේරුණේ නැහැ සර්" ඈ කීවා ය.

මඳ වේලාවක් යනතෙක් ඔහු කිසිවක් නොකීවේ ය.

"මං එහෙනං තියන්නද සර්" ස්නේහා ඇසුවා ය.

"ස්නේහා.." ඔහුගේ පහත් හඬින් කීවේ ය. "..අනවශ්‍ය මිනිස්සු ආශ්‍රය කරල කරදරේ වැටෙන්න එපා ස්නේහා.. ඔය මතුපිටින් හොඳයි වගේ පේන මිනිස්සුන්ගෙ හිත් ඇතුළ අන්තිම නරකයි.. ඔයාට තේරුම්ගන්න බැරි තරම් අවලස්සනයි"

"සර් කා ගැනද මේ කියන්නෙ?"

"මං කියන්නෙ මේනක ගැන.. එයා මහා ලොකු දොස්තර කෙනෙක් වෙන්න පුලුවන්.. ඒත් ඒ දොස්තර කමට රැවටෙන්න එපා.. ලොකු මිනිස්සු... සල්ලි කාරයෝ තමයි.. ඒත් එයාල හරිම අවස්ථාවාදී මිනිස්සු.. අද බොහොම අහිංසක මිනිහෙක් වගේ කෑම ටිකක් කන්න රෙස්ටොරන්ට් එකකට එකක් යයි.. ඒත් හෙට එයා ඔයාව එක්ක යන්නෙ වෙනින් තැනකට.. ඒක තේරුම් ගන්න" ඔහු සැළෙන හඬින් කීවේ ය. ඔහුගේ කටහඬෙහි ඇති නොසන්සුන් බව ඇයට දැනෙයි.

"එයා ඉතින් සර්ගෙ යාලුවෙක්නෙ" ස්නේහා කියන්නේ සැහැල්ලුවෙනි. මේනක පිළිබඳව මේ කියන කිසිම කතාවක් ඇයට වැදගත් නැත.

"යාලුවෙක් නිසා තමයි මං එයා ගැන දන්නෙ" ඔහු වහා කීවේ ය.

මේ කතාව අනවශ්‍ය එකකැයි ස්නේහාට සිතෙයි. ඇගේ සිතේ ඇතිවන්නේ කෝපයකි. මෙය අනවශ්‍ය මැදිහත්වීමකි. කිසිවකුට මේ ආකාරයට තමන්ගේ ජීවිතයට මැදිහත්වන්නට ඉඩ දිය නොහැකිය. මේ කරදරය අවසන් කළ යුතුයයි ඇගේ සිත කියයි.

"මේ අහන්න සර්.. මට ඔය කිසිම කෙනෙක්ගෙ කිසිම විශේෂත්වයක් නැහැ.. මනුස්ස කමට හිනාවෙනවා.. මනුස්ස කමට කතා කරනවා.. එච්චරයි.. හරියට සර් එක්ක මේ කතා කරනවා වගේ.... ඒ නිසා ඔය කතාව වැඩක්ම නැති කතාවක්.. මං තියනවා සර්.. මට මහන්සියි දැන්.. සර්ට කතා කරන්නම ඕනෙ නම් වෙන වෙලාවක කතා කරමු.." ස්නේහා අකලංක යමක් කියන්නට පෙරම දුරකතනය විසන්ධි කළා ය.

ඒ නිසසල රාත්‍රියේ බොහෝ වේලාවක් යනතෙක් ස්නේහා කල්පනා කරමින් සිටියා ය. අනවරත සිතුවිලි රැසක් ඇය පීඩාවට පත් කළේ ය. නින්ද ඇය සොයා ආවේ රාත්‍රියේ තුන්වෙනි යාමයේදී ය.



ස්නේහාගේත් අකලංකගේත් කතාව

මතු සම්බන්ධයි

1000 Business Cards + Design $150+gst
⊚420gsm Artboard ⊚Full Color Double Side Print ⊚Matt Lamination ⊚FREE Delivery Australia Wide
Say Hello : 0466 597 991 info@crystald.com.au | www.crystald.com.au

